SCSWC/CM/EX/8/7/2

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්/ජී/එස්එල්එස්පීසී /01/2024/16    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2025 ජූලි 08 දින

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත.

08 JUL 2025

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පිටපත් : - (1) ලේකම් - රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

(2) ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය
எனது இல.
My No. } පීඒඑල්/ජී/එස්එල්එස්පීසී/01/2024/16 ඔබේ අංකය
உமது இல.
Your No. } දිනය
திகதி
Date } 2025 ජුලි 08 දින

සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1958 අංක 04 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 14 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 13 හි 27 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් සාධාරණ අගයකට ගිණුම්ගත කළ යුතු වුවත් සංස්ථාව සතු වතු 16 න් වතු 15කට අයත් හෙක්ටයාර් 9,960 ක් වූ ඉඩම් වටිනාකම ගණනය කර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 55 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතයට ගත හැකි අවස්ථාවේ සිට ක්ෂය කිරීම් සිදුකළ යුතු වුවත් ගෝමර තේ කර්මාන්තශාලාව සඳහා මිලදීගෙන තිබූ වර්ණ විභේදන යන්ත්‍රය (Color Separate) 2023 මාර්තු 28 දින සිට නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කර තිබුණද යන්ත්‍රය සඳහා 2023 දෙසැම්බර් මාසයට පමණක් ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයට අදාළව රු. 2,169,966 ක් අඩුවෙන් ක්ෂය ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු නමුත්, ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබූ බැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු. 763,932,645ක් වූ සේවක ප්‍රතිලාභ බැඳීම් ශේෂයන්හි නිර්වද්‍යභාවය විගණනයේදී තහවුරු නොවිය.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 28 ඡේදය අනුව මූල්‍යම අයිතම පියවීමේදී පැන නගින විනිමය වෙනස්කම් ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතු වුවත් වර්ණ විභේදන යන්ත්‍රය (Color Separate) මිලදී ගැනීමට අදාළව පැන නැඟුන හුවමාරු අගයේ වෙනස්කම මත වූ ලාභය 2023 වර්ෂයේදී රු. 137,618 ක් හා 2024 වර්ෂයේදී රු. 3,405,805 ක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41හි 12 හා 30 ඡේදයන්ට හා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.2 අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනාගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු බව දක්වා ඇතත්, සංස්ථාවේ වතු 14 ක් පුරා විහිදුනු දැව අස්වනු නෙළිය හැකි ගස් 104,691 ක් ඇතුළුව ග්‍රාන්ඩිස්, ඇල්බිසියා, තේක්ක, යුකැලිප්ටස් යනාදී වනවගාවන් සමාලෝචිත වර්ෂය අවසානයටද නිසි තක්සේරු කිරීමකින් තොරව හෝ සාධාරණ අගයකට අගය කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 3,362,969,544 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. එසේම ප්‍රමිතයේ 43 ඡේදය ප්‍රකාරව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් පරිණත හා පරිණත නොවූ වගාවන් ලෙස වෙන වෙනම ඉදිරිපත් කල යුතු වුවද 2020 සිට 2024 දක්වා කාලය තුල සිටුවා තිබූ විවිධ දැවමය ශාක 32,820 ක් පරිණත හා පරිණත නොවූ ලෙස දක්වා නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන්හි දේපළ පිරියත හා උපකරණ වර්ග 06ක පිරිවැය රු.504,307,691 ක් වුවද ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛනය අනුව එහි අගය රු.380,289,813 ක් වූයෙන් රු.124,017,878 ක වෙනසක් නිරීක්ෂණය විය. සංස්ථාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය ගණනය කිරීම් අනුව ගොඩනැගිලි සඳහා රු. 218,769 ක් ක්ෂය වැඩියෙන් ද උපකරණ, ගෘහ භාණ්ඩ, මෝටර් රථ, පරිගණක හා යන්ත්‍ර සඳහා රු.1,038,206ක් ක්ෂය අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඌ) ගෝමර තේ කර්මාන්තශාලාවේ 2024 ජූලි 15 දින තේ වියලන යන්ත්‍රයට හා ගොඩනැගිල්ලට හානි වී තිබුණු අතර එම හානියේ වටිනාකම රු. 2,652,300 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර හානියට අදාළව රක්ෂණයෙන් රු. 2,200,630 ක් ලැබී තිබුණි. ඒ අනුව වත්කම් හානියෙන් රු. 451,670 ක අලාභයක් හඳුනාගෙන තිබුණි. වත්කම් ඉවත් කිරීමට අදාළ මුළු අලාභය රු. 45,386 ක් වුවත් වත්කම් ඉවත් කිරීමේ අලාභය රු. 451,670 ක් ලෙස දැක්වීමෙන් සංස්ථාවේ ලාභය රු. 406,284 කින් ඌණගණනය වී තිබුණි.

(එ) 2024 වර්ෂය තුළදී වලහන්දූව වතුයායේ රබර් ගස් 1007 ක් ටෙන්ඩර් කැඳවමින් රු. 3,791,359ක මිලකට අලෙවිකර තිබුණද එහි පිරිවැය ධාරක ජීව විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර නොතිබුණ නිසා වත්කම් අධිගණනය වී තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී ගස් විකිණීමෙන් රු. 141,951,100ක ආදායමක් උපයා තිබුණද එහි පිරිවැය හඳුනාගෙන වර්ෂයේ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයෙන් අඩුකර නොතිබුණු බැවින් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය අධි ගණනය වී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය සහ වර්ෂය තුල ගෙවන ලද පාරිතෝෂික වියදමද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල වෙනම ගලපා තිබුණු අතර ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකමෙන් පසුගිය වර්ෂයේ ශේෂය සමඟ වෙනස වූ රු. 41,025,510 ක වෙනස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුලින් ගලපා තිබුණි.

(ඕ) සංස්ථාවේ 2024 වර්ෂයේ බදු කුලී ආදායම රු.1,252,504 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් සංස්ථාවේ ලාභය අඩු වී තිබුණු අතර ලැබිය යුතු බදු කුලී ආදායම ද එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ක) 2024 දෙසැම්බර් 31 දිනට වතුයායන්හි වෙළඳ හා ණයගැති ශේෂය තුල ප්‍රධාන කාර්යාලය සහ වතු අතර, ප්‍රාදේශීය කාර්යාලය සහ වතු අතර හා වතුයායන් අතර භාණ්ඩ හුවමාරු කරගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුල එකිනෙකට හිලව් නොවූ රු. 166,412,556 ක ශේෂයක් පැවතුනි. ඒ තුල වර්ෂයකට වැඩි රු. 7,963,019,263 ක් වූ හර ශේෂයක් හා රු. 7,525,771,264 ක් වූ බැර ශේෂයක් විය. වතු ජංගම ගිණුමේ (Estate C/A Balance) හර ශේෂය තුල 2019 හා 2020 වර්ෂ වලට අදාලව වතුයායන් අතර පවතින ගනුදෙනු සටහන් කිරීමේදී අවශ්‍ය ජනල් සටහන් ඇතුලත් නොකිරීම හේතුවෙන් ඉතිරි වූ රු. 1,681,780,263 ක ශේෂයක් පැවතිනි. එය මෙතෙක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) ප්‍රධාන කාර්යාලයේ ගෙවිය යුතු ශේෂ තුළ ආපසු ගෙවිය යුතු තැන්පතු (Refundable Deposit) ලෙස රු.28,571,363 ක දීර්ඝ කාලයක සිට නිරවුල් නොවූ ශේෂයන් වූ අතර එම ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුනි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු ලපැම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ 15 හා 16 වන වගන්තිය | 2000 සිට 2024 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.695,690,845ක සේවක අර්ථසාධක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර ඒ මත ගෙවිය යුතු අධිභාරය 2024 දෙසැම්බර් 31 දිනට රු.85,854,420ක් විය. ඉහත අරමුදලට දායක නොවන වතු සේවකයින් වතු කාර්යමණ්ඩලයේ අර්ථසාධක අරමුදල (ESPS) වෙත ගෙවිය යුතු දායක මුදල රු.89,799,721ක්ද, වතු කළමනාකරුවන් ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය (CPPS) වෙත ද ගෙවිය යුතු මුදල රු. 21,984,422 ක්ද විය. |

| | | |
|---|---|---|
| (ආ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 02 වන කොටසේ 16(1) ඡේදය | 2000 සිට 2024 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා ගෙවිය යුතු දායක මුදල රු.47,537,485 ක් වන අතර ඒ මත ගෙවිය යුතු අධිභාර මුදල රු. 10,425,561 ක් විය. |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 5(1) වගන්තිය | 2010 සිට 2024 වර්ෂය දක්වා වතු සේවකයින් සඳහා රු.583,316,046 ක් ද ප්‍රධාන කාර්යාලයේ සේවකයින්ට රු.4,911,149 ක්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු මුළු පාරිතෝෂික මුදල රු. 588,227,195 ක් වූ අතර ඒ මත ගෙවිය යුතු අධිභාර මුදල රු. 27,777,163 ක් විය. |
| (ඈ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 18(1) වගන්තිය හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තිය | පනත ප්‍රකාරව 2018 සිට ඉන්වොයිස් පත්‍ර ඉදිරිපත් කල වර්ෂ 6 ක විගණන ගාස්තු රු.6,585,858 ක් ද, 1998 සිට 2017 වර්ෂ සඳහා වූ විගණන ගාස්තු රු.6,393,289 ක් ද ගෙවා නොතිබුණි. |
| (ඉ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | ආයතනය සතු වාහන 122 න් 74 ක් ම එනම් සියයට 61 ක්ම ධාවන තත්ත්වයේ නොමැති අතර ඒවායින් වැඩි ප්‍රමාණයක් වර්ෂ 8 – 14 කට පෙර සිටම ධාවන තත්ත්වයේ නොතිබුණු වාහන විය. 2024 පැවති පොදු ව්‍යාපාර කමිටුව මගින් ද වාහන අපහරණය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා තිබුණ ද 2025 මැයි 31 වන විටත් එම වාහන අපහරණය කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

(අ) 2020 සිට 2021 වර්ෂය දක්වා කාලය තුල නැවත දැවමය ගස් වගා කරන ලද රංගල කල්දූරියා කොටසේ ගම්පැල 2,600 ක්, යුකැලිප්ටස් 1,732 ක්, කැසියා 250 ක් හා කුඹුක් පැල 10 ක් සිටුවීමට රු. 1,065,150 ක මුදලක් වැයකර තිබුණද එම පැල සිටුවා නොතිබූ බව විගණනයේදී තහවුරු විය.

(ආ) සංස්ථාව සතු වතුයායන් මැනුම් කටයුතු සිදුකිරීමේදී වතුයායන් 06 ක ගැසට් මගින් ලද ඉඩම් ප්‍රමාණයට වඩා හෙක්ටයාර් 1,112 ක් අඩුවෙන්ද එක් වතුයායක හෙක්ටයාර් 3.19 ක් වැඩියෙන්ද තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය රු.මිලියන 1,655.78ක සෘණ අගයක් ගෙන තිබුණි. එසේම රු.මිලියන 2,181.12 ක්වූ ජංගම වගකීම් තුළ එකතුව රු.මිලියන 1,443.24ක දිගුකාලීනව ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් ශේෂයක්ද රු.මිලියන 221.98 ක බැංකු ණයක් හා රු. මිලියන 2.45 ක බැංකු අයිරාවක්ද වූ අතර සංස්ථාව ඌන කාරක ප්‍රාග්ධන ගැටළුවකට මුහුණපා ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු, ශේෂය වූ රු. 479,620,080 න් වර්ෂ 05 කට වඩා පැරණි රු. 253,147,140 ක ශේෂයක් වූ අතර ඒ තුල වර්ෂ 12 කට පෙර සිට පවතින රු. 219,546,538 ක ශේෂයක් විය. එය ගෙවිය යුතු ණයහිමි ශේෂයෙන් සියයට 46ක් විය.

(ඉ) ප්‍රධාන කාර්යාලයේ සහ වතුවල රු. 348,085,497 ක් වූ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 05 ඉක්මවා තිබුණු රු.58,872,707 ක ශේෂය අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)